# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2164/3 – 2020 පෙබරවාරි 24 වැනි සඳුදා – 2020.02.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 348/ඒ, නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නිට්ටඹුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/ATT/2017/309 හා 2017.10.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – අඹගහවත්ත හෙවත් මිරිස්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0028**

උතුරට: මාර්ගය (මා.සං.අ.), ඩබ්. ඒ. සරත් කුමාර වීරකෝන් හිමිකම් කියන අඹගහවත්ත සහ එන්. එම්. ඉන්ද්‍රානි හිමිකම් කියන අඹගහවත්ත හෙවත් මිරිස්වත්ත; නැගෙනහිරට: එන්. එම්. ඉන්ද්‍රානි හිමිකම් කියන අඹගහවත්ත හෙවත් මිරිස්වත්ත, එන්. එම්. සරත් කුමාර හිමිකම් කියන අඹගහවත්ත හෙවත් මිරිස්වත්ත සහ මාර්ගය (මා.සං.අ.); දකුණට සහ බටහිරට: මාර්ගය (මා.සං.අ.).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: 4-3/7/2017/HW/44.
2019 ඔක්තෝබර් මස 18 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 – 222


1A – G 32081 – 11 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*